රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 59/89

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1989 නොවැම්බර් මස 30 වන දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන් සහ සංස්ථා
සභාපතිවරුන් වෙත.

**ත්‍රස්තවාදී/කඩාකප්පල්කාරී ක්‍රියා හේතුවෙන් රාජ්‍ය නිලධාරියකුට/ සංස්ථා සේවකයකුට/සමුපකාර සේවකයකුට සහ අධිකරණ හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලියාපදිංචි කර ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුට සිදුකර ඇති තුවාල/මරණ සඳහා වන්දි ආදිය ගෙවීම.**

86.09.25 දිනැති අංක 343, 87.05.11 දිනැති අංක 369, 88.04.25 දිනැති අංක 14/88, 88.07.13 දිනැති අංක 21/88 සහ 88.09.09 දිනැති අංක 31/88 යන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරෙහි ඔබගේ අවධානය යොමු කෙරේ.

02. ඉහත දක්වා ඇති යෝජනා ක්‍රමය පිළිබඳව පහත දක්වා ඇති තීරණවලට රජය එළඹී තිබේ.

(අ) ඉහත දක්වා ඇති චක්‍රලේඛණවල සඳහන් වෙනත් වර්ගවල සිද්ධීන්ට අමතරව "කඩාකප්පල්කාරීන් සම්බන්ධව වූ කටයුතු" ද ආවරණය කිරීමට මෙම ක්‍රමය පුළුල් කළයුතුය.

(ආ) රාජකාරියේ යෙදී සිටියදී හෝ රාජකාරියේ යෙදී නොසිටියදී සිදුවන සිද්ධීන් වලට ද මෙම ක්‍රමය අදාල විය යුතුය.

(ඇ) මෙම ක්‍රමයේ අවශ්‍යතා සපුරා ඇත්නම් මෙම චක්‍රලේඛය නිකුත් කිරීමට පෙරාතුව සිදුවූ ත්‍රස්තවාදී/කඩාකප්පල්කාරී ක්‍රියා නිසා ඇති වූ තුවාල/මරණ පිළිබඳ සියළුම සිද්ධීන් මෙම ක්‍රමයේ දක්වා ඇති ගෙවීමේ ක්‍රමය මගින් ආවරණය කළයුතුය.

(ඈ) මෙම ක්‍රමය යටතේ වූ ප්‍රතිලාභවලට රාජ්‍ය, සංස්ථා සහ සමුපකාර අංශවල දෛනික වැටුප් ලබන සේවකයන්ටද/ අනියම් සේවකයන්ට ද හිමිකම තිබිය යුතුය.

(ඉ) මියගිය නිලධාරීන්ගේ/සේවකයන්ගේ යැපෙන්නන්ට වන්දි ගෙවීම ඉක්මන් කරනු පිණිස ප්‍රාදේශීය උප දිසාපතිවරුන් ( "ප්‍රාදේශීය ලේකම්වරුන් "-මගේ අංක. ඒබීකේ/එන්/පොදු/පීඒ හා 89.09.21 දිනැති ලිපියෙන් ප්‍රාදේශීය උප දිසාපතිවරුන් ගේ නිලනාමය 89.10.01 දින සිට බලපවත්වන පරිදි පළාත් සභාවේ " ප්‍රාදේශීය ලේකම් " යනුවෙන් වෙනස් කරන ලෙස පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්ට දන්වා යවා ඇති බව සටහන් කර ගන්න.) දිසාපතිවරුන් ගේ අධීක්ෂණය යටතේ වන්දි සඳහා වූ ඉල්ලීම් මුල් අවස්ථාවේදී පරීක්ෂා කර බලා එම ඉල්ලීම් ගෙවීම් කිරීම සඳහා අදාල අමාත්‍යාංශයට/දෙපාර්තමේන්තුවට/සංස්ථාවට ඉදිරිපත් කළයුතුය.

03. මෙම චක්‍රලේඛයේ (2) වැනි ඡේදයෙන් සංශෝධිත පරිදි රාජ්‍ය නිලධාරීන් සම්බන්ධව දැනට පවත්නා ක්‍රමය ක්‍රියාත්මක වනු ඇත. කෙසේ වෙතත් 86.10.08 දිනැති අංක 346 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් සහන එවැනි නිලධාරියකුට හෝ මියගිය නිලධාරියකුගේ යැපෙන්නන්ට වඩාත් වාසිදායක වන්නේ නම් එම සහන ලබා ගැනීමට අයිතිය ඇත. එහෙත් මෙම ක්‍රම දෙකම යටතේ සහන ලබාගත නොහැකිය. ඒ අනුව (එවැනි ගෙවීමක් කිරීමේ කාර්ය සඳහා පමණක් ) 86.10.08 දිනැති අංක 346 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මෙම චක්‍රලේඛයේ (2) වැනි ඡේදය අනුව සුදුසු ලෙස සංශෝධිතය වූ සේ සැලකිය යුතුය.

04. මෙම චක්‍රලේඛයේ (2) වැනි ඡේදයෙන් සංශෝධිත පරිදි සංස්ථා සේවකයන් සඳහා වූ දැනට පවත්නා ක්‍රමය ක්‍රියාත්මක වනු ඇත. කෙසේ වෙතත් රාජ්‍ය අනුග්‍රහයෙන් වූ රක්ෂණ හෝ වන්දි ගෙවීමේ වඩාත් වාසිදායක ක්‍රමයක් ඇත්නම් එම ක්‍රමය යටතේ සහන ලබාගත හැකිය. එහෙත් ක්‍රම දෙකම යටතේ සහන ලබාගැනීමට සේවකයන්ට අයිතියක් නොමැත.

05. දැනට රාජ්‍ය නිලධාරීන් සඳහා වන ක්‍රමය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සඳහා එවැනි සේවක කොන්දේසිවලට යටත්ව අදාල වනු ඇත. කෙසේ වෙතත් මෙම ක්‍රමය යටතේ සහන ලැබීම සඳහා හිමිකම ලැබීමට එවැනි පුද්ගලයන්ගේ නම් අධිකරණ හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේඛනගත කරවා තිබිය යුතුය.

06. රාජ්‍ය නිලධාරීන්ට අදාලවන වෛද්‍යාධාර දීමනාවට සහ ඉපයීමේ හැකියාව නැතිවීම සඳහා වූ දීමනාවට, රාජ්‍ය සංස්ථාවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ද, සමුපකාර සංගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ද, සමුපකාර සංගම්වල සේවය කරන සේවකයන්ද හිමිකම් ලබති. ත්‍රස්තවාදී/කඩාකප්පල්කාරී ක්‍රියා වලින් මරණයට පත්වූ අවස්ථාවන දී ඔවුන්ගේ යැපෙන්නන් රුපියල් 1,00,000/- ක සානුකම්පිත දීමනාවකට හිමිකම ලබති. කුමන හේතුවක් නිසාවත් එවැනි තැනැත්තන්ට වැටුප් ආදිය නොගෙවනු ඇත. මෙම ගණයේ තැනැත්තන්ට වන්දි ගෙවීම සඳහා අවශ්‍ය අරමුදල් නොමැති අවස්ථාවල භාණ්ඩාගාරය විසින් අවශ්‍ය මුදල් සපයා දෙනු ඇත.

3....(

07. මෙම චක්‍රලේඛයේ හෝ ඉහතින් සඳහන් කරන ලද අනෙකුත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛණවල හෝ සඳහන් කරුණු අර්ථ නිරූපනය කිරීම පිළිබඳව ඇති ගැටළු නිරාකරණය කරලීම පිණිස රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, අදාළ රාජ්‍ය අමාත්‍යතුමා ගේ ලේකම් සහ රාජ්‍ය පරිපාලන රාජ්‍ය අමාත්‍යතුමාගේ ලේකම් යන අයගෙන් සමන්විත කමිටුවක් පත්කරනු ලැබ ඇත. එහෙයින් එබඳු අවස්ථා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකළ යුතුය.

08. පළාත් සභා ඡන්ද විමසීම් සහ පාර්ලිමේන්තු ඡන්ද විමසීම් වෙනුවෙන් තරග කිරීම පිණිස සිය තනතුරුවලින්, ඉල්ලා අස්වූ සහ එම ඡන්ද විමසීම් වලදී අපේක්ෂකයින් වශයෙන් සිටියදී ඝාතනය කරණ ලද රජයේ සේවකයන්ගේ සහ ගුරුවරුන්ගේ යැපෙන්නන්ට, එසේ ඝාතනයට පාත්‍ර වූ අය සාමාන්‍යයෙන් විශ්‍රාම ලබන වයසට එළඹෙනතුරු වන කාලය සඳහා ඔවුන්ගේ සාමාන්‍ය වැටුපත්, ඉන් අනතුරුව ඔවුන්ගේ විශ්‍රාම වැටුපත් ගෙවිය යුතුය.

09. ඉහත ක්‍රමය යටතේ වන කරුණු ගැන ක්‍රියා කිරීම කඩිනම් කිරීම සඳහා අදාල බලධාරීන්ට පහසු කරවනු පිණිස පහත දක්වා ඇති පැහැදිලි කිරීම් කරනු ලැබේ.

(I) මෙම ක්‍රමය යටතේ වන සහනවලට රජයේ දෙපාර්තමේන්තුවල ආදේශක කම්කරුවෝද, උප තැපැල් ස්ථානාධිපතිවරු ද හිමිකම ලබති.

(II) 86.09.25 දිනැති අංක 343 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ නිලධාරියකුගේ වැටුප් ගෙවිය යුතු වූ විට එසේ ගෙවිය යුතු මුදල ගණන් බැලිය යුත්තේ 88.07.13 දිනැති අංක 21/88 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2ඇ(I) ඡේදයේ දක්වා ඇති පදනම යටතේය. (මෙම චක්‍රලේඛයේ 03,04 හා 05 ඡේද සමග එක්ව කියවීමට.)

(III) ආයතන සංග්‍රහයේ L පරිච්ඡේදයේ 1 වන ඡේදයේ "ස්ත්‍රී පුරුෂ භේදය" යන වචනයට දී ඇති අර්ථ නිරූපනය කෙරෙහි ඔබේ අවධානය යොමු කරනු ලැබේ. මෙම අර්ථ නිරූපනය, "නිලධාරියා", "සේවකයා", "භාර්යාව" සහ "ස්වාමිපුරුෂයා" යන වචන අර්ථ නිරූපනය කිරීමේදී යොදාගත යුතුය.

(IV) ඉපයීමේ හැකියාව නැතිවීම සඳහා වන්දි වශයෙන් ගෙවනු ලබන සානුකම්පිත දීමනාව 88.07.13 දිනැති අංක 21/88 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 හා 11 ඡේදයේ දක්වා ඇත. වෛද්‍ය වාර්තාවේ දක්වා ඇති ඉපයීමේ හැකියාව නැතිවීමේ ප්‍රතිශතය එසේ දක්වා ඇති ප්‍රතිශතයන් අතරට වැටෙන අවස්ථාවල දී ගෙවිය යුතු වන්දිය සමානුපාතික පදනම අනුව තීරණය කළයුතුය.

( පී.එන්.එම්.ප්‍රනාන්දු )
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය.